දුම්රිය
புகையிரத
Railway — GMF 35

ඔබේ අංකය
உமது இல
Your No.

දුරකථනය (දු.සා)
தொலைபேசி (இ.பு.பொ.மு)
Telephone

E- mail: gmrsir@sltnet.lk

කාර්යාලය
அலுவலகம்
Office — 2421281

ෆැක්ස්
தொலைநகல்
Fax — 2446490


# ශ්‍රී ලංකා දුම්රිය සේවය
# இலங்கை புகையிரத சேவை
# SRI LANKA RAILWAYS


මගේ අංකය
எனது இல
My No. — GMR/Media/03/03

සාමාන්‍යාධිකාරී කාර්යාලය,
තැ.පෙ 355, ඕල්කොට් මාවත,
කොළඹ 10.

பொது முகாமையாளர்
அலுவலகம்
த. பெ. 355இ ஒல்கொட்
மாவத்தை
கொழும்பு 10

General Manager's Office,
P.O. Box 355, Olcott Mawatha,
Colombo 10.


දිනය
தேதி
Date — 2025/08/29

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.

**<u>පේරාදෙණිය - මහනුවර දුම්රිය ස්ථාන අතර දුම්රිය හරස් මාර්ගයේ සිදුකරන හදිසි නඩත්තු කටයුතු හේතුවෙන් දුම්රිය ධාවනය සීමා කිරීම.</u>**

පේරාදෙණිය - මහනුවර අතර පිහිටි ගැටඹේ දුම්රිය හරස් මාර්ගයේ සිදුකරන සංවර්ධන කටයුතු හේතුවෙන් 2025 සැප්තැම්බර් මස 05, 06, සහ 07 වන දින වලදී පහත සඳහන් දුම්රියන් දෙක පමණක් පේරාදෙණිය සිට මහනුවර අතර හා මහනුවර සිට පේරාදෙණිය අතර ධාවනය නොවේ.

| දුම්රිය අංකය සහ නම | සාමාන්‍ය දිනවල ධාවනය වූ ආකාරය | 2025/09/05,06, සහ 07 දිනවල ධාවනය වන ආකාරය | 2025/09/05,06, සහ 07 දිනවල පේරාදෙණියෙන් පිටත්වන වේලාව |
|---|---|---|---|
| 1024 (ටිකිරි මැණිකේ ) | නානුඔය-පේරාදෙණිය - මහනුවර-පේරාදෙණිය-කොළඹ කොටුව | නානුඔය - පේරාදෙණිය - කොළඹ කොටුව | පෙ.ව 11.05 |
| 1015 (උඩරට මැණිකේ) | කොළඹ කොටුව - පේරාදෙණිය - මහනුවර-පේරාදෙණිය- බදුල්ල | කොළඹ කොටුව - පේරාදෙණිය - බදුල්ල | පෙ.ව 11.30 |

මෙම දුම්රියන් වලින් ගමන් පහසුකම් සලසා ගැනීම සඳහා මහනුවර දුම්රිය ස්ථානය වෙත පැමිණෙන මගීන්ට බස්රථ මගින් මහනුවර සිට පේරාදෙණිය දක්වා ප්‍රවාහන පහසුකම සලසා ඇත.

එම දුම්රියන් දෙකේ පැමිණෙන ගමනාන්ත දුම්රිය ස්ථානය මහනුවර වූ මගීන් සඳහා පේරාදෙණිය සිට මහනුවර දක්වා ප්‍රවාහන පහසුකම සලසා ඇත.

මීට අමතරව බදුල්ල සිට පැමිණෙන අංක 1016 (උඩරට මැණිකේ) දුම්රිය ඉහත දක්වන ලද 2025 සැප්තැම්බර් මස 05, 06, සහ 07 වන දින වල පේරාදෙණියට පැය 12.58 ට පැමිණ විනාඩි 32 ක කාලයක් පේරාදෙණිය දුම්රිය ස්ථානයේ නවත්වා තබා පැය 13.30 ට පේරාදෙණිය දුම්රිය ස්ථානයෙන් මහනුවර දක්වා ධාවනය කර නැවත මහනුවර සිට කොළඹ කොටුව දක්වා ධාවනය වේ.

අසංක සමරසිංහ
අධිකාරී (ගමනාගමන)
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට

ජී.ඩී.ඒ. සමරසිංහ
අධිකාරී (ගමනාගමන)
අධිකාරී (ගමනාගමන) කාර්යාලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
කොළඹ - 10